# පංචස්කන්ධයෝ යනු පංචූපාදනස්කන්ධයෝම ය.

## ඛුද්දකනිකාය / පටිසම්භිදාමග්ගපාළි / මහාවග්ගො / ඤාණකථා / උදයබ්බයඤාණනිද්දෙසො උදයව්‍යය ඤාණය

කථං පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං? ජාතං රූපං පච්චුප්පන්නං, තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිණාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං. ජාතා වෙදනා...පෙ.... ජාතා සඤ්ඤා... ජාතා සඞ්ඛාරා... ජාතං විඤ්ඤාණං... ජාතං චක්ඛු...පෙ.... ජාතො භවො පච්චුප්පන්නො, තස්ස නිබ්බත්තිලක්ඛණං උදයො, විපරිණාමලක්ඛණං වයො, අනුපස්සනා ඤාණං.

කෙසේනම් වර්තමාන ධර්මයන්ගේ විපරිණාමය දන්නා ප්‍රඥාව උදයබ්බයානුපස්සනා ඤාණය වේද? උපන් රූපය වර්තමාන නමි. එම රූපයාගේ හටගැනීමේ ලක්ෂණය උදය නමි. අවසන්වීමේ ලක්ෂණය වය නමි. නැවත නැවත නුවණින් බැලීම ඤාණ නමි. වේදනා පෙ, සංඥා පෙ, සංඛාර, විඤ්ඤාණ පෙ .......... ඇස පෙ, කණ පෙ, නාසය, දිව පෙ, කය පෙ, මනස පෙ ........

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො කති ලක්ඛණානි පස්සති? පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො පඤ්චවීසති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො පඤ්ඤාස ලක්ඛණානි පස්සති.

පංචස්කන්ධයාගේ උදය ලක්ෂණය දක්නේ කෙතෙක් ලක්ෂණ දකීද, වය ලක්ෂණය දක්නේ කෙතෙක් ලක්ෂණ දකීද ? උදය හා වය දක්නේ කෙතෙක් ලක්ෂණ දකීද, ස්කන්ධ පඤ්චකයාගේ උදය දක්නේ ලක්ෂණ විසිපහක් දකියි. වය දක්නේ ලක්ෂණ විසිපහක් දකී. උදය හා වය දක්නේ ලක්ෂණ පණසක් දකී.
රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති? අවිජ්ජාසමුදයා රූපසමුදයොති - පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. තණ්හාසමුදයා රූපසමුදයොති - පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. කම්මසමුදයා රූපසමුදයොති - පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. ආහාරසමුදයා රූපසමුදයොති - පච්චයසමුදයට්ඨෙන රූපක්ඛන්ධස්ස උදයං පස්සති. නිබ්බත්තිලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස උදයං පස්සති. රූපක්ඛන්ධස්ස උදයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති. රූප ස්කන්ධයාගේ උදය (හටගැනීම) දක්නේ කුමන ලක්ෂණ පහ දක්නේද?

- ✓ අවිද්‍යාව හේතු ප්‍රත්‍යවීමෙන් රූපයාගේ හටගැනීම වෙයි. ප්‍රත්‍ය උදාවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ උදය දකියි.

- ✓ තෘෂ්ණාව හේතු ප්‍රත්‍යවීමෙන් රූපයාගේ හටගැනීම වෙයි. ප්‍රත්‍ය උදාවීම අර්ථයෙන් රූප ස්කන්ධයාගේ උදය දකියි.

- ✓ කර්මය හේතු ප්‍රත්‍යවීමෙන් රූපයාගේ හටගැනීම වෙයි. ප්‍රත්‍ය උදාවීම අර්ථයෙන් රූප ස්කන්ධයාගේ උදය දකියි.

- ✓ ආහාරය හේතු ප්‍රත්‍යවීමෙන් රූපයාගේ හටගැනීම වෙයි. ප්‍රත්‍ය උදාවීම අර්ථයෙන් රූප ස්කන්ධයාගේ උදය දකියි.

- ✓ ඉපදීමේ ලක්ෂණය දක්නේ රූපස්කන්ධයාගේ හටගැනීම දකියි.

රූපස්කන්ධයාගේ උදය (හටගැනීම) දක්නේ මේ ලක්ෂණ පහ දකියි.

රූපක්ඛන්ධස්ස වයං පස්සන්තො කතමානි පඤ්ච ලක්ඛණානි පස්සති? අවිජ්ජානිරොධා රූපනිරොධොති - පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. තණ්හානිරොධා රූපනිරොධොති - පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. කම්මනිරොධා රූපනිරොධොති - පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති. ආහාරනිරොධා රූපනිරොධොති - පච්චයනිරොධට්ඨෙන රූපක්ඛන්ධස්ස වයං පස්සති . විපරිණාමලක්ඛණං පස්සන්තොපි රූපක්ඛන්ධස්ස වයං පස්සති. රූපක්ඛන්ධස්ස වයං පස්සන්තො ඉමානි පඤ්ච ලක්ඛණානි පස්සති. උදයබ්බයං පස්සන්තො ඉමානි දස ලක්ඛණානි පස්සති.

රූප ස්කන්ධයාගේ වය (අවසානය) දක්නේ කුමන ලක්ෂණ පහ දක්නේද ?

- ✓ අවිද්‍යාව නිරෝධවීමෙන් රූපයාගේ අවසානය වෙයි. ප්‍රත්‍ය නිරෝධවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ වය දකියි.

- ✓ තෘෂ්ණාව නිරෝධවීමෙන් රූපයාගේ අවසානය වෙයි. ප්‍රත්‍ය නිරෝධවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ වය දකියි.

- ✓ කර්මය නිරෝධවීමෙන් රූපයාගේ අවසානය වෙයි. ප්‍රත්‍ය නිරෝධවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ වය දකියි.

- ✓ ආහාරය නිරෝධවීමෙන් රූපයාගේ අවසානය වෙයි. ප්‍රත්‍ය නිරෝධවීම අර්ථයෙන් රූපස්කන්ධයාගේ වය දකියි.

- ✓ විපරිණාම (විනාශය කරා පෙරළීමේ) ලක්ෂණය දක්නේ රූපස්කන්ධයාගේ වය දකියි.

රූපස්කන්ධයාගේ වය (අවසානය) දක්නේ මේ ලක්ෂණ පස දකියි. උදය හා වය දක්නේ මේ ලක්ෂණ දහය දකියි.

වෙදනාක්ඛන්ධස්ස .... පෙ, සඤ්ඤාක්ඛන්ධස්ස....පෙ, සඞ්ඛාරක්ඛන්ධස්ස....පෙ, විඤ්ඤාණක්ඛන්ධස්ස .... පෙ ...............

පඤ්චන්නං ඛන්ධානං උදයං පස්සන්තො ඉමානි පඤ්චවීසති ලක්ඛණානි පස්සති, වයං පස්සන්තො ඉමානි පඤ්චවීසති ලක්ඛණානි පස්සති, උදයබ්බයං පස්සන්තො ඉමානි පඤ්ඤාස ලක්ඛණානි පස්සති. තං ඤාතට්ඨෙන ඤාණං, පජානනට්ඨෙන පඤ්ඤා. තෙන වුච්චති - පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානුපස්සනෙ ඤාණං.

පංචස්කන්ධයාගේ හටගැනීම දක්නේ මේ විසිපස් ලක්ෂණයන් දකී. අවසානය දක්නේ මේ විසිපස් ලක්ෂණයන් දකී. හටගැනීම හා අවසානය දක්නේ මේ පනස් ලක්ෂණ දකී. මේ එය දැනගැනීම් අර්ථයෙන් ඤාණ නම්. ප්‍රත්‍යක්ෂ වශයෙන් අවබෝධවීම් අර්ථයෙන් ප්‍රඥා නම්. එසේ හෙයින් හේතුඵල ධර්මයන්ගේ විපරිණාමය නුවණින් දැක දැනගැනීමේ ප්‍රඥාව උදයබ්බයානුපස්සනාඤාණ නමැයි කියනු ලැබේ.

රූපක්ඛන්ධො ආහාරසමුදයො. වෙදනා, සඤ්ඤා, සඞ්ඛාරා - තයො ඛන්ධා ඵස්සසමුදයා. විඤ්ඤාණක්ඛන්ධො නාමරූපසමුදයො.

රූපස්කන්ධය ආහාර හේතුවෙන් හටගත්තේය. වෙදනා සංඥා සංස්කාර යන ස්කන්ධ තුන ස්පර්ශ හේතුවෙන් හටගන්නාහ. විඤ්ඤාණස්කන්ධය නාමරූප හේතුවෙන් උපදින්නේ ය.

## අරිහතුන් වහන්සේද පංච උපාදානස්කන්ධය අනුපස්සනා කළ යුත්තාහ.

සංයුත්තනිකායොඛන්ධකවග්ගො / ඛන්ධසංයුත්තං / උපරිපණ්ණාසකො / ධම්මකථිකවග්ගො

## සීල සුත්තං

එකං සමයං ආයස්මා ච සාරිපුත්තො ආයස්මා ච මහාකොට්ඨිකො බාරාණසියං විහරන්ති ඉසිපතනෙ මිගදායෙ. අථ ඛො ආයස්මා මහාකොට්ඨිකො සායන්හසමයං පටිසල්ලානා වුට්ඨිතො යෙනායස්මා සාරිපුත්තො තෙනුපසඞ්කමි...පෙ.... එතදවොච -

මා විසින් මෙසේ අසන ලදී. එක් සමයෙක්හි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ හා ආයුෂ්මත් මහා කොට්ඨිත ස්ථවිරයන් වහන්සේද මිගදාය නම්වූ ඉසිපතනයෙහි වාසය කරත්. එකල්හි ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ සවස් කාලයෙහි විවේකයෙන් නැගී සිටියේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ යම් තැනකද එතැනට පැමිණියහ. පැමිණ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සමග සතුට එළවන කථා කළසේක. සතුටු විය යුතු සිහිකටයුතු කථා අවසන්කොට එකත්පසක හිඳගත්හ. එකත්පසක හිඳගත් ආයුෂ්මත් මහාකොට්ඨිත ස්ථවිරයන් වහන්සේ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේට මෙය කීහ.

සීලවතාවුසො, සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසිකාතබ්බා’ති?

සීලවතාවුසො, කොට්ඨික, භික්ඛුනා පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසි කාතබ්බා. කතමෙ පඤ්ච? සෙය්‍යථීදං - රූපුපාදානක්ඛන්ධො, වෙදනුපාදානක්ඛන්ධො, සඤ්ඤුපාදානක්ඛන්ධො, සඞ්ඛාරුපාදානක්ඛන්ධො, විඤ්ඤාණුපාදානක්ඛන්ධො. සීලවතාවුසො, කොට්ඨික, භික්ඛුනා ඉමෙ

පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසි කාතබ්බා. ඨානං ඛො පනෙතං, ආවුසො, විජ්ජති යං සීලවා භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො...පෙ.... අනත්තතො යොනිසො මනසි කරොන්තො සොතාපත්තිඵලං සච්ඡිකරෙය්‍යා’ති.

ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සිල්වත් භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කළ යුතුද?

අයුෂ්මත් කොට්ඨිත, සිල්වත් භික්ෂුව විසින් පංච උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. ඒ කවර පසක්ද? එනම්, රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යන මොහුයි. ආයුෂ්මත් කොට්ඨිතයෙනි, සිල්වත් භික්ෂුව විසින් මේ පස් උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. යම් සිල්වත් භික්ෂුවක් මේ පඤ්චඋපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ සොතාපත්තිඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේ ය.

සොතාපන්නෙන පනාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසි කාතබ්බා’ති?

සොතාපන්නෙනපි ඛො, ආවුසො කොට්ඨික, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො...පෙ.... අනත්තතො යොනිසො මනසි කාතබ්බා. ඨානං ඛො පනෙතං, ආවුසො, විජ්ජති යං සොතාපන්නො භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො...පෙ.... අනත්තතො යොනිසො මනසි කරොන්තො සකදාගාමිඵලං සච්ඡිකරෙය්‍යා’ති.

ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සොතාපන්න භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?

ආයුෂ්මත් කොට්ඨිතයෙනි, සොතාපන්න භික්ෂුව විසින්ද මේ පඤ්චඋපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කළ යුතුය. සොතාපන්න මහණතෙමේ මේ පඤ්චඋපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ සකෘදාගාමිඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේ ය.

සකදාගාමිනා පනාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසි කාතබ්බා’ති?

සකදාගාමිනාපි ඛො, ආවුසො කොට්ඨික, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො...පෙ.... අනත්තතො යොනිසො මනසි කාතබ්බා. ඨානං ඛො පනෙතං, ආවුසො, විජ්ජති යං සකදාගාමී භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො...පෙ.... අනත්තතො යොනිසො මනසි කරොන්තො අනාගාමිඵලං සච්ඡිකරෙය්‍යා’ති.

ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, සකෘදාගාමි භික්ෂුව විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?

ආයුෂ්මත් කොට්ඨිතයෙනි, සකෘදාගාමි භික්ෂුව විසින්ද මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන් රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන් හුලක් වශයෙන් විපතක් වශයෙන් ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන් බිඳෙන්නක් වශයෙන් සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කටයුතුයි. යම් සකෘදාගාමි භික්ෂුවක් මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගණ්ඩයක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන් තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ අනාගාමි ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේ ය.

අනාගාමිනා පනාවුසො සාරිපුත්ත, භික්ඛුනා කතමෙ ධම්මා යොනිසො මනසි කාතබ්බා’ති? අනාගාමිනාපි ඛො, ආවුසො කොට්ඨික, භික්ඛුනා ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධා අනිච්චතො…පෙ…. අනත්තතො යොනිසො මනසි කාතබ්බා. ඨානං ඛො පනෙතං, ආවුසො, විජ්ජති යං අනාගාමී භික්ඛු ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො…පෙ…. අනත්තතො යොනිසො මනසි කරොන්තො අරහත්තං සච්ඡිකරෙය්‍යා’ති.

ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, අනාගාමි මහණ විසින් කවර ධර්මයන් නුවණින් මෙනෙහි කටයුතුද?

ආයුෂ්මත් කොට්ඨිතයෙනි, අනාගාමි භික්ෂුව විසින් ද මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන් ගණ්ඩයක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන්, තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කටයුතුය. යම් අනාගාමි භික්ෂුවක් මේ පඤ්ච උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන් දුක් වශයෙන්, රෝග වශයෙන්, ගණ්ඩයක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන්, තමා නොවන්නක්

වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන් අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කරන්නේ අරිහත් ඵලය ප්‍රත්‍යක්ෂ කරන්නේය යන යමක් වේ නම් ඊට හේතු ඇත්තේ ය.

**අරහතා පනාවුසො සාරිපුත්ත, කතමෙ ධම්මා යොනිසො මනසි කාතබ්බා’ති?**

**අරහතාපි ඛො, ආවුසො කොට්ඨිත, ඉමෙ පඤ්චුපාදානක්ඛන්ධෙ අනිච්චතො දුක්ඛතො රොගතො ගණ්ඩතො සල්ලතො අඝතො ආබාධතො පරතො පලොකතො සුඤ්ඤතො අනත්තතො යොනිසො මනසි කාතබ්බා. නත්ථි, ඛ්වාවුසො, අරහතො උත්තරි කරණීයං කතස්ස වා පතිචයො, අපි ච ඉමෙ ධම්මා භාවිතා බහුලීකතා දිට්ඨධම්මසුඛවිහාරා චෙව සංවත්තන්ති සතිසම්පජඤ්ඤා චා’ති.**

**ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, රහත්වූ භික්ෂුව විසින් කවර ධර්මයන් මෙනෙහි කටයුතුද?**

**ආයුෂ්මත් කොට්ඨිතයෙනි, අරහත් භික්ෂුව විසිනුදු පඤ්ච උපාදානස්කන්ධයන් අනිච්ච වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගණ්ඩයක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ආබාධ වශයෙන්, තමා නොවන්නක් වශයෙන්, බිඳෙන්නක් වශයෙන්, සූන්‍ය වශයෙන්, අනත්ත වශයෙන් නුවණින් මෙනෙහි කටයුතුයි. ආයුෂ්මතුනි, රහතන් වහන්සේ විසින් මත්තෙහි කළ යුත්තක් හෝ කරණ ලද දෙයෙහි නැවත කිරීමක් නැත. එහෙත් භාවිතා කරණ ලද්දාවූ පුරුදු කරණ ලද්දාවූ මේ ධර්මයෝ ඉහාත්ම සුඛ විහරණය පිණිසද සිහිනුවණ පිණිසද පවතිත්.**

# මහාපුණ්ණමසුත්තං
## (මජ්ඣිමනිකාය / උපරිපණ්ණාසපාළි / දෙවදහවග්ගො)

ඉමෙ නු ඛො, භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධා, සෙය්‍යථිදං - රූපුපාදානක්ඛන්ධො, වෙදනුපාදානක්ඛන්ධො, සඤ්ඤුපාදානක්ඛන්ධො, සඞ්ඛාරුපාදානක්ඛන්ධො, විඤ්ඤාණුපාදානක්ඛන්ධො’ති.

ස්වාමීනි, මොව්හු පඤ්චොපාදානස්කන්ධයෝ නොවෙත්ද? කවරහුදයත්? රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය” යනුයි.

ඉමෙ ඛො පන, භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධා; සෙය්‍යථිදං - රූපුපාදානක්ඛන්ධො, වෙදනුපාදානක්ඛන්ධො, සඤ්ඤුපාදානක්ඛන්ධො, සඞ්ඛාරුපාදානක්ඛන්ධො, විඤ්ඤාණුපාදානක්ඛන්ධො’ති.

මහණ, මොවුහු වනාහි පඤ්චොපාදානස්කන්ධයෝයි කෙසේදයත්? රූප උපාදානස්කන්ධය, වේදනා උපාදානස්කන්ධය, සඤ්ඤා උපාදානස්කන්ධය, සංස්කාර උපාදානස්කන්ධය, විඤ්ඤාණ උපාදානස්කන්ධය යනුයි.

ඉමෙ ඛො පන, භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධා කිංමූලකා’ති?

ස්වාමීනි මේ පඤ්චොපාදානස්කන්ධයෝ වනාහි කුමක් මුල්කොට පවත්නාහුද?

**ඉමෙ ඛො, භික්ඛු, පඤ්චුපාදානක්ඛන්ධා ඡන්දමූලකා’ති**

**මහණ, මේ පඤ්චොපාදානස්කන්ධයෝ ඡන්දරාගය මුල්කොට පවත්නාහ.**

තඤ්ඤෙව නු ඛො, භන්තෙ, උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා උදාහු අඤ්ඤත්‍ර පඤ්චහි උපාදානක්ඛන්ධෙහි උපාදානන්ති?

ස්වාමීනි, ඒ පඤ්චොපාදානස්කන්ධයෝම උපාදානය වෙයිද, නොහොත් පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙන් අන්‍ය වූවක් උපාදානය වෙයිද?

**න ඛො, භික්ඛු, තඤ්ඤෙව උපාදානං තෙ පඤ්චුපාදානක්ඛන්ධා, නාපි අඤ්ඤත්‍ර පඤ්චහි උපාදානක්ඛන්ධෙහි උපාදානං, අපි ච යො තත්ථ ඡන්දරාගො තං තත්ථ උපාදාන’න්ති.**

**මහණ, ඒ පඤ්චොපාදානස්කන්ධයෝ උපාදානය නොවේ. පඤ්චොපාදානස්කන්ධයෙන් අන් තැනෙක්හිද උපාදාන නොවේ. එසේ වුවද, ඒ පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි යම් ඡන්දරාගයක් වෙයිද, එය එහි උපාදානය වේ.**

සියා පන, භන්තෙ, පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවෙමත්තතා’ති?

ස්වාමීනි, පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි පවත්නා ඡන්දරාගයෙහි වෙනසක් ඇත්තේද?

සියා, භික්ඛූ'ති භගවා අවොච - 'ඉධ, භික්ඛු, එකච්චස්ස එවං හොති - 'එවංරූපො සියං අනාගතමද්ධානං, එවංවෙදනො සියං අනාගතමද්ධානං, එවංසඤ්ඤො සියං අනාගතමද්ධානං, එවංසඞ්ඛාරො සියං අනාගතමද්ධානං, එවංවිඤ්ඤාණො සියං අනාගතමද්ධාන'න්ති. එවං ඛො, භික්ඛු, සියා පඤ්චුපාදානක්ඛන්ධෙසු ඡන්දරාගවෙමත්තතා'ති.

මහණ, ඇතැයි භාග්‍යවතුන් වහන්සේ වදාළසේක. මහණ මේ ලොකයෙහි ඇතැමෙකුට මෙසේ අදහස් වෙයි. අනාගත කාලයෙහි මෙබඳු රූප ඇත්තෙක් වෙම්වා, අනාගත කාලයෙහි මෙබඳු වේදනා ඇත්තෙක් වෙම්වා, අනාගත කාලයෙහි මෙබඳු සඤ්ඤා ඇත්තෙක් වෙම්වා, අනාගත කාලයෙහි මෙබඳු සංස්කාර ඇත්තෙක් වෙම්වා, අනාගත කාලයෙහි මෙබඳු විඤ්ඤාණ ඇත්තෙක් වෙම්වා, මහණ, පඤ්ච උපාදානස්කන්ධයන් කෙරෙහි පවත්නා ඡන්දරාගයේ මෙබඳු වෙනස් බව වන්නේ ය.

කිත්තාවතා නු ඛො, භන්තෙ, ඛන්ධානං ඛන්ධාධිවචන'න්ති?

ස්වාමීනි, කිනම් අර්ථයකින් ස්කන්ධයන්ට, ස්කන්ධ යන ව්‍යවහාරය වන්නේද?

යං කිඤ්චි, භික්ඛු, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, අයං වුච්චති රූපක්ඛන්ධො. යා කාචි වෙදනා... යා කාචි සඤ්ඤා ... යෙ කෙචි සඞ්ඛාරා... යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, අයං වුච්චති විඤ්ඤාණක්ඛන්ධො. එත්තාවතා ඛො, භික්ඛු, ඛන්ධානං ඛන්ධාධිවචන'න්ති.

මහණෙ, අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද, යම්කිසි රූපයෝ වෙත්ද, මේ රූපස්කන්ධයයි කියනු ලැබේ.

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද, යම්කිසි වේදනාවෝ වෙත්ද, මේ වේදනා ස්කන්ධයයි කියනු ලැබේ.

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද, යම්කිසි සංඥාවෝ වෙත්ද, මේ සංඥා ස්කන්ධයයි කියනු ලැබේ.

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම්කිසි සංස්කාරයෝ වෙත්ද, මේ සංස්කාර ස්කන්ධයයි කියනු ලැබේ.

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, සමීපවූද යම්කිසි විඤ්ඤාණයෝ වෙත්ද, මේ විඤ්ඤාණස්කන්ධයයි කියනු ලැබේ.

මහණෙ, මෙතෙකින් ස්කන්ධයන්ගේ ස්කන්ධ යන ව්‍යවහාරය වේ.

කො නු බො, භන්තෙ, හෙතු කො පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො වෙදනාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො සඤ්ඤාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො සඞ්ඛාරක්ඛන්ධස්ස පඤ්ඤාපනාය, කො හෙතු කො පච්චයො විඤ්ඤාණක්ඛන්ධස්ස පඤ්ඤාපනායා’ති?

ස්වාමීනි, රූපස්කන්ධයාගේ පැණවීම පිණිස, හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? වේදනා ස්කන්ධයාගේ පැණවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? සංඥාස්කන්ධයාගේ පැණවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? සංස්කාර ස්කන්ධයාගේ පැණවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද? විඤ්ඤාණ ස්කන්ධයාගේ පැණවීම පිණිස හේතුව කවරේද? ප්‍රත්‍යය කවරේද?

චත්තාරො ඛො, භික්ඛු, මහාභූතා හෙතු, චත්තාරො මහාභූතා පච්චයො රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. ඵස්සො හෙතු ඵස්සො පච්චයො වෙදනාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. ඵස්සො හෙතු ඵස්සො පච්චයො සඤ්ඤාක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. ඵස්සො හෙතු, ඵස්සො පච්චයො සඞ්ඛාරක්ඛන්ධස්ස පඤ්ඤාපනාය. නාමරූපං හෙතු, නාමරූපං පච්චයො විඤ්ඤාණක්ඛන්ධස්ස පඤ්ඤාපනායා’ති.

මහණ, රූපස්කන්ධයාගේ පැණවීම පිණිස, සතර මහා භූතයෝ හේතුව ය, සතර මහාභූතයෝ ප්‍රත්‍ය ය. වේදනා ස්කන්ධයාගේ පැණවීම පිණිස ස්පර්ශය හේතුව ය, ස්පර්ශය ප්‍රත්‍යය. සංඥාස්කන්ධයාගේ පැණවීම පිණිස ස්පර්ශය හේතුව ය, ස්පර්ශය ප්‍රත්‍ය ය. සංස්කාර ස්කන්ධයාගේ පැණවීම පිණිස ස්පර්ශය හේතුව ය, ස්පර්ශය ප්‍රත්‍යය. විඤ්ඤාණස්කන්ධයාගේ පැණවීම පිණිස නාමරූප හේතුව ය, නාමරූප ප්‍රත්‍ය ය.

කථං පන, භන්තෙ, සක්කායදිට්ඨි හොතී’ති?

ස්වාමීනි, සක්කායදිට්ඨිය කෙසේ නම් වන්නේද?

ඉධ, භික්ඛු, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො රූපං අත්තතො සමනුපස්සති,

රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං... සඤ්ඤං... සඞ්ඛාරෙ... විඤ්ඤාණං... අත්තතො සමනුපස්සති, විඤ්ඤාණවන්තං වා අත්තානං, අත්තනි වා විඤ්ඤාණං, විඤ්ඤාණස්මිං වා අත්තානං.

එවං ඛො, භික්ඛු, සක්කායදිට්ඨි හොතී'ති.

මහණ, මේ ලොකයෙහි ආර්යයන් නුදුටු ආර්යධර්මයෙහි අදක්ෂ, ආර්ය ධර්මයෙහි නොහික්මුණු, සත්පුරුෂයන් නුදුටු, සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ, සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණු අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ මෙසේ නුනුවණින් දකියි.

රූපය මම වශයෙන් දකියි. මම රූපය ඇත්තෙක් වශයෙන් දකියි. රූපය මට අයත්වූවක් (මම තුළ රූප පවතී) වශයෙන් දකියි. මම රූපයට අයත් වූවෙක් (රූපය තුළ මම පවතී) වශයෙන් දකියි.

වේදනාව මම වශයෙන් දකියි. මම වේදනාව ඇත්තෙක් වශයෙන් දකියි. වේදනාව මට අයත්වූවක් (මම තුළ වේදනා පවතී) වශයෙන් දකියි. මම වේදනාවට අයත් වූවෙක් (වේදනාව තුළ මම පවතී) වශයෙන් දකියි.

සංඥාව මම වශයෙන් දකියි. මම සංඥාව ඇත්තෙක් වශයෙන් දකියි. සංඥාව මට අයත්වූවක් (මම තුළ සංඥා පවතී) වශයෙන් දකියි. මම සංඥාවට අයත්වූවෙක් (සංඥා තුළ මම පවතී) වශයෙන් දකියි.

සංස්කාරය මම වශයෙන් දකියි. මම සංස්කාර ඇත්තෙක් වශයෙන් දකියි. සංස්කාර මට අයත්වූවක් (මම තුළ සංස්කාර පවතී) වශයෙන් දකියි. මම සංස්කාරයන්ට අයත්වූවෙක් (සංස්කාර තුළ මම පවතී) වශයෙන් දකියි.

විඤ්ඤාණ මම වශයෙන් දකියි. මම විඤ්ඤාණ ඇත්තෙක් වශයෙන් දකියි. විඤ්ඤාණ මට අයත්වූවක් (මම තුළ විඤ්ඤාණ පවතී) වශයෙන් දකියි. මම විඤ්ඤාණයට අයත්වූවෙක් (විඤ්ඤාණ තුළ මම පවතී) වශයෙන් දකියි.

මහණ, මෙසේ වනාහි සක්කායදිට්ඨිය පවතී.

කථං නු ඛො, භන්තෙ, සක්කායදිට්ඨි හොතී'ති?

ස්වාමීනි, කෙසේ වනාහි සක්කායදිට්ඨිය නොවන්නේද?

ඉධ, භික්ඛු, සුතවා අරියසාවකො අරියානං දස්සාවී අරියධම්මස්ස කොවිදො අරියධම්මෙ සුවිනීතො, සප්පුරිසානං දස්සාවී සප්පුරිසධම්මස්ස කොවිදො සප්පුරිසධම්මෙ සුවිනීතො න රූපං අත්තතො සමනුපස්සති, න රූපවන්තං වා අත්තානං; න අත්තනි වා රූපං, න රූපස්මිං වා අත්තානං; න වෙදනං... න සඤ්ඤං... න සඞ්ඛාරෙ... න විඤ්ඤාණං අත්තතො සමනුපස්සති, න විඤ්ඤාණවන්තං වා අත්තානං; න අත්තනි වා විඤ්ඤාණං, න විඤ්ඤාණස්මිං වා අත්තානං. එවං ඛො, භික්ඛු, සක්කායදිට්ඨි න හොතී'ති.

මහණ මේ ශාසනයෙහි ආර්යයන් දුටු, ආර්යධර්මයෙහි දක්ෂ, ආර්ය ධර්මයෙහි හික්මුණු, සත්පුරුෂයන් දුටු, සත්පුරුෂ ධර්මයෙහි දක්ෂ සත්පුරුෂ ධර්මයෙහි හික්මුණු, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක තෙමේ මෙසේ නුවණින් දකියි.

රූපය මම වශයෙන් නොදකියි. මම රූපය ඇත්තෙක් වශයෙන් නොදකියි. රූපය මට අයත්වූවක් (මම තුළ රූප පවතී) වශයෙන් නොදකියි. මම රූපයට අයත් වූවෙක් (රූපය තුළ මම පවතී) වශයෙන් නොදකියි.

වේදනාව මම වශයෙන් නොදකියි. මම වේදනාව ඇත්තෙක් වශයෙන් නොදකියි. වේදනාව මට අයත්වූවක් (මම තුළ වේදනා පවතී) වශයෙන් නොදකියි. මම වේදනාවට අයත් වූවෙක් (වේදනාව තුළ මම පවතී) වශයෙන් නොදකියි.

සංඥාව මම වශයෙන් නොදකියි. මම සංඥාව ඇත්තෙක් වශයෙන් නොදකියි. සංඥාව මට අයත්වූවක් (මම තුළ සංඥා පවතී) වශයෙන් නොදකියි. මම සංඥාවට අයත්වූවෙක් (සංඥා තුළ මම පවතී) වශයෙන් නොදකියි.

සංස්කාරය මම වශයෙන් නොදකියි. මම සංස්කාර ඇත්තෙක් වශයෙන් නොදකියි. සංස්කාර මට අයත්වූවක් (මම තුළ සංස්කාර පවතී) වශයෙන් නොදකියි. මම සංස්කාරයන්ට අයත්වූවෙක් (සංස්කාර තුළ මම පවතී) වශයෙන් නොදකියි.

විඤ්ඤාණ මම වශයෙන් නොදකියි. මම විඤ්ඤාණ ඇත්තෙක් වශයෙන් නොදකියි. විඤ්ඤාණ මට අයත්වූවක් (මම තුළ විඤ්ඤාණ පවතී) වශයෙන් නොදකියි. මම විඤ්ඤාණයට අයත්වූවෙක් (විඤ්ඤාණ තුළ මම පවතී) වශයෙන් නොදකියි.

මහණ, මෙසේ වනාහී සක්කායදිට්ඨිය නොපවතී.

කො නු ඛො, භන්තෙ, රූපස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණං, කො වෙදනාය… කො සඤ්ඤාය… කො සඞ්ඛාරානං… කො විඤ්ඤාණස්ස අස්සාදො, කො ආදීනවො, කිං නිස්සරණ’න්ති ?

ස්වාමීනි, රූපයාගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද? වේදනාවගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද? සංඥාවගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද?

නිස්සරණය කුමක්ද? සංස්කාරයාගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද? විඤ්ඤාණයාගේ ආශ්වාදය කවරේද? ආදීනවය කවරේද? නිස්සරණය කුමක්ද?

යං ඛො, භික්ඛු, රූපං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං - අයං රූපස්ස අස්සාදො. යං රූපං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං - අයං රූපස්ස ආදීනවො. යො රූපස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං - ඉදං රූපස්ස නිස්සරණං. යං වෙදනං පටිච්ච... යං සඤ්ඤං පටිච්ච... යෙ සඞ්ඛාරෙ පටිච්ච... යං විඤ්ඤාණං පටිච්ච උප්පජ්ජති සුඛං සොමනස්සං - අයං විඤ්ඤාණස්ස අස්සාදො. යං විඤ්ඤාණං අනිච්චං දුක්ඛං විපරිණාමධම්මං - අයං විඤ්ඤාණස්ස ආදීනවො. යො විඤ්ඤාණස්මිං ඡන්දරාගවිනයො ඡන්දරාගප්පහානං - ඉදං විඤ්ඤාණස්ස නිස්සරණ'න්ති.

මහණ, රූපය හේතුකොටගෙන යම් සැපයක් සොම්නසක් උපදියිද, ඒ රූපයේ ආශ්වාදයයි. යම් රූපයක් අනිච්චද දුකද, විනාශය කරා පෙරළෙන ස්වභාවයෙන් යුක්තද, මේ රූපයේ ආදීනවයයි. රූපයන්හී යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වෙයිද, මෙය රූපයෙහි නිස්සරණයයි.

වේදනාව හේතුකොටගෙන යම් සැපයක් සොම්නසක් උපදියිද, මේ වේදනාවේ ආශ්වාදයයි. යම් වේදනාවක් අනිච්චද, දුකද, විනාශය කරා පෙරළෙන ස්වභාවයෙන් යුක්තද, මේ වේදනාවේ ආදීනවයයි. වේදනාවන්හී යම් ඡන්දරාගය දුරුකිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වෙයිද, මේ වේදනාවෙහි නිස්සරණයයි.

සංඥාව හේතුකොටගෙන යම් සැපයක්, සොම්නසක් උපදියිද, මේ සංඥාවේ ආශ්වාදයයි. යම් සංඥාවක් අනිච්චද, දුකද, විනාශය කරා පෙරළෙන ස්වභාවයෙන් යුක්තද, මේ සංඥාවේ ආදීනවයයි. සංඥාවන්හී යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වෙයිද, මේ සංඥාවෙහි නිස්සරණයයි.

සංස්කාරය හේතුකොටගෙන යම් සැපයක් සොම්නසක් උපදියිද, මේ සංස්කාරයේ ආශ්වාදයයි. යම් ඒ සංස්කාරයක් අනිච්චද, දුකද, විනාශය කරා පෙරළෙන ස්වභාවයෙන් යුක්තද, මේ සංස්කාරයේ ආදීනවයයි. සංස්කාරයන්හී යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වෙයිද, මේ සංස්කාරයෙහි නිස්සරණයයි. විඤ්ඤාණය හේතුකොටගෙන යම් සැපයක් යම් සොම්නසක් උපදියිද, මේ විඤ්ඤාණයේ ආශ්වාදයයි. යම් විඤ්ඤාණයක් අනිච්චද, දුකද, විනාශය කරා පෙරළෙන ස්වභාවයෙන් යුක්තද, මේ විඤ්ඤාණයේ ආදීනවයයි. විඤ්ඤාණයන්හී යම් ඡන්දරාගය දුරු කිරීමක්, ඡන්දරාගය පහකිරීමක් වෙයිද, මේ විඤ්ඤාණයෙහි නිස්සරණයයි.

කථං නු ඛො, භන්තෙ, ජානතො, කථං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානානුසයා න හොන්තී'ති?

ස්වාමීනි, කෙසේ දන්නහුට, කෙසේ දක්නහුට, මේ 'විඤ්ඤාණය සහිත සිරුරෙහිද, බාහිරද, සියලු ආරම්මණයන්හිද මමය, මාගේයයි" ගැනීම මානානුසය යන මොව්හු නොවෙත්ද?

යං කිඤ්චි, භික්ඛු, රූපං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං රූපං - 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. යා කාචි වෙදනා... යා කාචි සඤ්ඤා... යෙ කෙචි සඞ්ඛාරා... යං කිඤ්චි විඤ්ඤාණං අතීතානාගතපච්චුප්පන්නං අජ්ඣත්තං වා බහිද්ධා වා ඔළාරිකං වා සුඛුමං වා හීනං වා පණීතං වා යං දූරෙ සන්තිකෙ වා, සබ්බං විඤ්ඤාණං - 'නෙතං මම, නෙසොහමස්මි, න මෙසො අත්තා'ති එවමෙතං යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. එවං ඛො, භික්ඛු, ජානතො එවං පස්සතො ඉමස්මිඤ්ච සවිඤ්ඤාණකෙ කායෙ බහිද්ධා ච සබ්බනිමිත්තෙසු අහඞ්කාරමමඞ්කාරමානානුසයා න හොන්තී''ති.

මහණෙතෙම අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, ළඟවූද, යම්කිසි රූපයක් වේද, ඒ සියලු රූප මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේ යයි, මෙසේ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දකියිද,

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, ළඟවූද, යම්කිසි වේදනාවක් වේද, ඒ සියලු වේදනා මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේ යයි, මෙසේ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දකියිද,

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, ළඟවූද, යම්කිසි සංඥාවක් වේද, ඒ සියලු සංඥා මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේ යයි, මෙසේ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දකියිද,

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, ළඟවූද, යම්කිසි සංස්කාරයක් වේද, ඒ සියලු සංස්කාර මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේ යයි, මෙසේ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දකියිද,

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, අධ්‍යාත්මිකවූද, බාහිරවූද, රළුවූද, සියුම්වූද, හීනවූද, ප්‍රණීතවූද, දුරවූද, ළඟවූද, යම්කිසි විඤ්ඤාණයක් වෙයිද, ඒ සියලු විඤ්ඤාණ මගේ නොවේ, මම නොවෙමි, මගේ ආත්මය නොවේ යයි, මෙසේ තත්වූ පරිද්දෙන් මනා ප්‍රඥාවෙන් දකියිද,

මහණ මෙසේ දන්නහුට, මෙසේ දක්නහුට, මේ සවිඤ්ඤාණක සිරුරෙහිද, බාහිර වූ සියලු ආරම්මණයන්හිද, 'මමය, මගේයයි' ගැනීම සහ මානානුසය යන මොහු නොවෙත්.

# නුවණින් විමසා බැලීමෙන්ම යමක් පිළිගත යුත්තාහ.

**මා අනුස්සවෙන, මා පරම්පරාය, මා ඉතිකිරාය, මා පිටකසම්පදානෙන, මා තක්කහෙතු, මා නයහෙතු, මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා 'සමණො නො ගරු'ති.**

**ඇසූ පමණකින්ද පිළිනොගනුව. පරම්පරාවෙන් පැවත ආ නිසාද පිළිනොගනුව. මෙය මෙසේ විය හැකියැයිද පිළිනොගනුව. පිටකය හා ගැළපේයැයිද පිළිනොගනුව. තර්කයට අනුකූල නිසාද පිළිනොගනුව. න්‍යායට අනුකූල නිසාද පිළිනොගනුව. මේ කාරණය කල්පනාකරනලදැයිද පිළිනොගනුව. ස්වකීය දෘෂ්ටියට සමාන නිසාද පිළිනොගනුව. මොහු යහපත් නිසා මොහුගේ කීම යහපතැයිද පිළිනොගනුව. ශ්‍රමණ ගරුත්වය නිසාද පිළිනොගනුව.**

**යදා තුම්හෙ, අත්තනාව ජානෙය්‍යාථ - ඉමෙ ධම්මා අකුසලා, ඉමෙ ධම්මා සාවජ්ජා, ඉමෙ ධම්මා විඤ්ඤුගරහිතා, ඉමෙ ධම්මා සමත්තා සමාදින්නා අහිතාය දුක්ඛාය සංවත්තන්තී'ති, අථ තුම්හෙ, පජහෙය්‍යාථ.**

**යම් කලෙක්හි තෙපි මේ ධර්මයෝ අකුසල්ය. මේ ධර්මයෝ වරද සහිතය, මේ ධර්මයෝ නුවණැත්තන් විසින් ගර්හා කරන ලදහ. පුරන ලද්දා වූ, සමාදන්වන ලද්දා වූ මේ ධර්මයෝ අහිත දුක් පිණිස පවතිත් යයි, තුමූම ප්‍රඥාවෙන් දන්නාහුද, එසේ ඇති කල්හි, තෙපිම ඒ අකුසල ධර්මයන් දුරු කරන්නාහු ය.**